# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No } HAF/01/02/HD/2019 | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2020.03. 24 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**ඇඳිරි නීතිය ඉවත් කළ පසු මහජනයා ඒකරාශිවීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පාරිභෝගික සේවා සැපයීම**

ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම තාවකාලිකව ඉවත් කළ වහාම මහජනතාව වෙළඳසැල් වලට ඒකරාශිවීම හේතුවෙන් කොරෝනා මර්ධන වැඩපිළිවෙළින් අපේක්ෂිත අරමුණු අඩපණවීමට ඉඩ ඇත.එබැවින් පාරිභෝගිකයින්ගේ නිවෙස් වෙත අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හා එළවළු සැපයීමේ වැඩපිළිවෙළක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. දැනටමත් සමහර දිස්ත්‍රික්කවල මෙය ඉතා හොඳින් ක්‍රියාත්මක වේ.

02. ඒ අනුව ස.තො.ස., සමුපකාර හා ඔබ දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී මට්ටමේ වෙළඳ සංගම් සම්බන්ධ කර ගනිමින් අත්‍යාවශ්‍ය එළවළු හා අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය දඹුල්ල (කළමනාකරු දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය 0714459509), මැනිං වෙළඳපොළ හෝ වෙනත් ආසන්නතම ආර්ථික මධ්‍යස්ථානවලින් ලබාගෙන තම ප්‍රදේශයේ පාරිභෝගික ජනතාව වෙත බෙදාහැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුවේ.

03. මෙහිදී යම්කිසි වටිනාකමකට සරිලන එළවළු, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මල්ලක් සකස් කර ( රු.200/-, රු.500/- හෝ රු.1,000/- බැගින්) බෙදාහැරීමට කටයුතු කිරීම වඩාත් ප්‍රායෝගික වේ. එසේ බෙදාහැරිය යුතු ප්‍රදේශ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර, සමුපකාර , වෙළඳ සංගම් වල හා පුද්ගලික අංශයේ කුඩා ලොරි රථ මේ සඳහා යොදා ගත හැකිවේ. මෙමඟින් ඇඳිරි නීතිය ඉවත් කළ වහාම වෙළඳසැල් වෙත සිදුවන මහජන ඒකරාශීවීම අවම කිරීම අපේක්ෂා කරන අතරම, අත්‍යාවශ්‍ය භාණ්ඩ මහජනයා වෙත අවම මිලකට ලබාදීම ද අපේක්ෂා කෙරේ.

04. බිත්තර, එළවළු හා අත්‍යාවශ්‍ය භාණ්ඩ ප්‍රවාහන රථ සඳහා ඇඳිරි නීති බලපත්‍ර අවශ්‍ය නොවන අතර, ඒ පිළිබඳව සියළුම පොලිස් ස්ථාන දැනුවත් කර , වැඩබලන පොලිස්පතිවරයා විසින් නියෝග නිකුත් කර ඇති අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදේශයේ පොලිසියේ සහාය ද ලබා ගන්න.

එස් හෙට්ටිආරච්චි
ලේකම්

පිටපත්

1. ජනාධිපති ලේකම් කාර්යාලය - කරු. දැ. ගැ. ස.
2. ලේකම්, වෙළඳ අමාත්‍යාංශය - කරු. දැ. ගැ. ස.
3. කොරෝනා වැළැක්වීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී මධ්‍යස්ථානය - කරු. දැ. ගැ. ස.


දුරකතන / தொலைபேசி / Telephone } 011-2696211-13, 011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2695279 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } information@pubad.gov.lk | ලිපිනය / முகவரி / Address } නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திர சதுக்கம் கொழும்பு 07 இலங்கை Independence Square, Colombo 07, Sri Lanka

වෙබ් අඩවිය/ இணையத்தளம் / Website : www.pubad.gov.lk